**තිරප්පනේ ප්‍රාදේශීය සභාව**

**2022.09.20 වන දින පෙ.ව 10.00 ට පැවති මහ සභා රැස්වීම**

***පැමිණ සිටි ගරු මන්ත්‍රීවරුන්:***

| | | |
|---|---|---|
| 1. | ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා | |
| 2. | ඒ.ජී.මරියහාමි මැතිනිය | - ගරු සභාපතිතුමා |
| 3. | ඒ. අන්වර් සදාක් මැතිතුමා | - ගරු උපසභාපතිතුමිය |
| 4. | එස්.තිස්ස විජේසිංහ මැතිතුමා | - ගරු සභික තුමා |
| 5. | එච්.එම්.නාසිම් මැතිතුමා | - ගරු සභික තුමා |
| 6. | ජී.නිමල් රාජපක්ෂ මැතිතුමා | - ගරු සභික තුමා |
| 7. | බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා | - ගරු සභික තුමා |
| 8. | එච්.බී.නලින් හේරත් මැතිතුමා | - ගරු සභික තුමා |
| 9. | ආර්.පී.නිසංසලා ලක්මාලි අබේරත්න මැතිනිය | - ගරු සභික තුමිය |
| 10. | කේ. නදීකා සෙව්වන්දි කරුණාරත්න මැතිනිය | - ගරු සභික තුමිය |
| 11. | ජේ.රෝහණ විජේතිලක මැතිතුමා | - ගරු සභික තුමා |
| 12. | ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා | |

***නොපැමිණි ගරු මන්ත්‍රීවරුන් :***

| | | |
|---|---|---|
| 1. | පී.මධුර කුමාර පියරත්න මැතිතුමා | - ගරු සභික තුමා |
| 2. | ආර්. ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා | - ගරු සභික තුමා |
| 3. | ටිකිරි බංඩාර වනසිංහ මැතිතුමා | - ගරු සභික තුමා |

***නොදන්වා නොපැමිණි ගරු මන්ත්‍රීවරුන් :***

| | | |
|---|---|---|
| 1. | එන්.රශ්මි සංකල්පනා මැතිනිය | - ගරු සභිකතුමිය |

***සහභාගී වූ නිළධාරීන් ;***

| | | |
|---|---|---|
| 1. | ආර්.පී.පී. රේණුකා ලියනගේ මිය | - ලේකම් |
| 2. | එම්.ආර්.ඩබ්.සී.කේ.රණවීර මිය | - විෂය ලිපිකරු |

**(අ) පසුගිය රැස්වීම් වාර්තා සම්මත කිරීම.**

**- 2022.08.09 දින පැවති ගරු මහා සභා වාරයේ වාර්තාව සභා සම්මත කිරීම.**

අද දිනට නියමිත ගරු මහා සභාවේ න්‍යාය පත්‍රයේ මුලින්ම තිබෙන්නේ 2022.08.09 දින පැවති ගරු මහ සභා වාර්තාව සභා සම්මත කර ගැනීමයි.ඒ අනුව පසුගිය සභා වාර්තාවට සංශෝධන තිබෙනම් ඒවා ඉදිරිපත් කරන ලෙසත්, පසුගිය සභා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

**යෝජනා අංක 133 – 09 -2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි,ගරු මහ සභාවෙන් අවසරයි. 2022.08.09 දින පැවති ගරු මහා සභා වාර්තාව සත්‍ය හා නිවැරදි බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් 2022 අගෝස්තු මස 09 වන දින පැවති ගරු මහාසභා වාර්තාව පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.*

**(ආ) ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.**

විශේෂ නිවේදන යටතේ කියන්න තියෙන්නේ ෆාදර් කෙනෙක්ගේ මූලිකත්වයෙන් මේ එළඹෙන ඔක්තෝබර් මස 01 වන දින පෙ.ව.10.00 ට තුරු සෙවන පාක් එක ළඟ සිට ප්‍රධාන මාර්ගයේ රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා කියලා දැනුම් දුන්නා.ඒ සඳහා ඔබ සියළු දෙනාට සහභාගී වෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒ වගේම පසුගිය දවසක පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නිලධාරින් සමඟ මමත් ලේකම්තුමියත් නාත්තන්ඩිය ප්‍රාදේශිය සභාවට අධ්‍යයන චාරිකාවකට ගියා.එහෙ ආදායමයි මෙහෙ ආදායමයි අහසට පොළොව වගේ.ඉදිරියේදී සියළු දෙනා සහභාගී කරගෙන නාත්තන්ඩියට ප්‍රාදේශීය සභාවට යමු.ඒ වගේ තිරප්පනේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ හිඟ ආදායම් විශාල ප්‍රමාණයක් එකතු කරගන්න තියෙනවා.ඒත් ගෙවා ගන්න මිනිස්සුන්ට සල්ලි නෑ.ඒවා එකතු කරගන්න කොට්ඨාශ මන්ත්‍රීවරුන් විදිහට ඔබ සියළුදෙනා ඒ සඳහා සහාය ලබා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.නිවාස කමිටුවෙන් හිඟ කඩ කාමර ආදායම් අය කර ගන්න ලබන සතියේ සමථ මණ්ඩලයට යොමු කරන්න අයදුම්පත්‍ර සම්පූර්ණ කළා.ඒ අනුව සභාවේ ආදායම් තත්ත්වය ඉහල නංවා ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

**(ඇ) ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ , පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන මහා සභාවට ඉදිරිපත් කිරීම.**

- ඒ අනුව ආදායම් පරික්ෂක මහත්මා විසින් 2022 අගෝස්තු මස ආදායම් වාර්තාව ඉදිරිපත් කර සිටිනවා.ඒ අනුව අගෝස්තු මස ආදායම ලෙස රු.203,029.74 ක මුදලක් ආදායම් පරික්ෂක මහතා විසින් එකතු කර තිබෙනවා.එයද මම දැන ගැනීම සඳහා ගරු මහ සභාවට ඉදිරිපත් කරනවා.
- 2022 වර්ෂයේ මුඛ හා කුර රෝගය නිසා වසා තැබූ මාස 03 ක් සඳහා බදු මුදල් නිදහස් කරන ලෙස මහා සභා අනුමැතිය ලැබුණු අතර එම ඉල්ලීම පනතේ ප්‍රතිපාදන වලට පටහැනි බැවින් ඉල්ලීම ඉටු කළනොහැකි බවට පළාත් පාලන කොමසාරිස්තුමා විසින් සටහනක් යොදා ඇති ලිපිය ගරු මහා සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරනවා.

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**

කිසිවක් නැත.

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**ලිපි අංක - I .**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියෙන් ලබා දෙන මූලික අරමුදල් BT- 4 හා BT -5 සඳහා නව ව්‍යාපෘති යෝජනා හඳුනා ගැනීම යටතේ කෘෂි නිෂ්පාදන සඳහා පොදු වෙළඳපලක් ඉදි කිරීම - දෙවන අදියර නැමැති ව්‍යාපෘති යෝජනාව ඇතුළත් කරමින් පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යවන ලද ලිපිය ගරු මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

කඩකාමරවල ඉතිරි කොටස් නිම කරන්න සභාවේ යෝජනාවක් විදිහට ඕන.මේ සඳහා මේ වන විට රු.මිලියන 30 ක දළ ඇස්තමේන්තුවක් සකස් කරලා තියෙනවා.

**යෝජනා අංක 134 – 09 -2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.**

සියළු දෙනාගෙන්ම අවසරයි. කෘෂි නිෂ්පාදන සඳහා පොදු වෙළඳපලක් ඉදි කිරීම දෙවන අදියර ව්‍යාපෘති යෝජනාව සුදුසු බව මම යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපතිනි - ඒ.ජී.මරියහාමි මැතිණිය**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - II .**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

කඳුපාගම , ලබුනෝරුව පදිංචි එස්.පී.සිරිසේන මහතා විසින් සත්ත්ව පාලන ගොවිපලක් පවත්වා ගෙන පිහිටි අක්කර 18 ක ඉඩම සඳහා දීර්ඝ කාලීන බදුබලපත්‍රය ලබා ගැනීම වෙනුවෙන් වූ බදු මුදල වන රු.406,500.00 ක මුදල අඩු කර ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා.

**යෝජනා අංක 135 – 09 -2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

ඇත්තටම සතුටුයි ප්‍රාදේශිය ලේකම් කාර්යාලය බදු සම්බන්ධයෙන් මෙපමණ කාර්යක්ෂමතාවයකින් කටයුතු කිරිම සම්බන්ධයෙන්.මිනිස්සුන්ට අවු.25-30 ක් විතර ඔප්පුවක් හදා ගන්න ගතවෙනවා. මේ වගේ මුදලක් නොමැති කෙනෙක් අක්කර 20 ක් සංවර්ධනය කරන්නේ කොහොමද? ඒ නිසා මෙම බදු මුදල අයකර ගැනිම සුදුසු බවට මම යෝජනා කරනවා.මේ සම්බන්ධයෙන් එම පුද්ගලයාට අවබෝධ කරවන්න.නිවාස කමිටුව මැදිහත් වෙලා සභාවේ හිඟ ආදායම් ගොඩක් අය කරලා දුන්නා.කොච්චර හොඳ දේවල් කලත් නරක දේ ඉක්මනින් ප්‍රචාරය වෙනවා.

ඒ වගේම පසුගිය දිනවල සියළු මාධ්‍ය වලින් දේශපාලඥයෝ රට විනාශ කලා කියලා ප්‍රචාරය කළා.ලංකාවේ රාජ්‍ය සේවකයන්ට සාපේක්ෂව දේශපාලඥයෝ ඉතාම සිමිත ප්‍රමාණයක් ඉන්නේ. ලංකාවේ රාජ්‍ය සේවකයෝ ලක්ෂ 16 ක් පමණ ඉන්නවා. හැමෝම නෙවේ රාජ්‍ය සේවකයන්ගෙන් 75% ක් පමණ රටේ විනාශයට වගකිවයුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.**

බදු අයකර ගැනිමට සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසිමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - III .**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ප්‍රසම්පාදන කමිටු සාමාජිකාවක් වන රශ්මි සංකල්පනා මැතිණිය ගමන් අපහසුතා නිසා ප්‍රසම්පාදන කමිටු රැස්වීමට නොපැමිණෙන නිසා වෙනත් අයෙකු කමිටු සාමාජිකයෙක් ලෙස පත් කර ගැනිම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනිම සඳහා ඉදිරිපත් කරමි.

**යෝජනා අංක 136 – 09 -2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.**

ප්‍රසම්පාදන කමිටුවේ නව සාමාජිකාව ලෙස කේ.නදීකා සෙව්වන්දි කරුණාරත්න මැතිණිය සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපතිනි - ඒ.ජී.මරියහාමි මැතිණිය**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසිමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**(ඊ) කාරක සභාවල වාර්තා ඉදිරිපත් කිරිම**.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

කාරක සභා වාර්තා ඉදිරිපත් කිරිම යටතේ පහත සඳහන් කමිටු වාර්තා ගරු මහ සභාවට ඉදිරිපත් කර සිටිනවා.

I. 2022.08.15 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව.
II. 2022.08.15 වන දින පැවති කාර්මික කමිටු වාර්තාව.
III. 2022.08.30 පරිසර හා පහසුකම් කමිටු වාර්තාව.

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ඉදිරිපත් කිරිම.**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

2022 අගෝස්තු මස ආදායම් වියදම් අයකර ගැනිම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (එල්.ජී.06) හා මාසික වියදම් වාර්තාව ( එල්.ජී.13) ගරු මහා සභාවේ දැන ගැනිම සඳහා මෙන්ම අනුමැතිය සඳහා ද ඉදිරිපත් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.**

ගරු සභාපතිතුමනි,අගෝස්තු මස මාසික වියදම් වාර්තාවේ මුද්‍රන හා ලිපිද්‍රව්‍ය වියදම විදිහට රු.238,414.40 ක වියදමක් දරා තිබෙනවා.ඒ පිළිපඳව පැහැදිලි කිරිමක් කරන මෙන් මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මාස කිපයක් තිසිසේ කාර්යාලයේ ලිපිද්‍රව්‍ය සඳහා වැයවුනු මුදල් උසාවි දඩ ලැබීම මත ගිය මාසේ ගෙවීම් කළා.ඒ මුදල තමා ලිපි ද්‍රවය වියදම ලෙස සඳහන් වෙන්නේ.

**යෝජනා අංක 137 – 09 -2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, සියළුම දෙනාගෙන් අවසරයි. සභාවට ඉදිරිපත් කරන ලද 2022 අගෝස්තු මස ආදායම් වියදම් අයකර ගැනිම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (එල්.ජී.06) හා මාසික වියදම් වාර්තාව ( එල්.ජී.13) සත්‍ය වාර්තා බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා.**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකගතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**(ඌ) නොපැමිණෙන මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අවසර ලිපි ඉදිරිපත් කිරිම.**

පී.මධුර කුමාර පියරත්න මැතිතුමා , ආර්. ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා , ටිකිරි බංඩාර වනසිංහ මැතිතුමා යන සභික වරුන් විසින් නොපැමිණෙන බවට දැනුම් දීලා තියෙනවා.

**(එ) ගරු සභිකවරුන්ගේ වෙනත් අදහස් ඉදිරිපත් කිරිම.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.**

කඩ කාමර මේ වන විට තක්සේරු කරලා නෑ. ඒ නිසා සම්පූර්ණයෙන්ම හදලා විධිමත් තක්සේරුවක් කරලා ටෙන්ඩර් ලබා දෙනවා නම් හොඳයි.එතකොට ඕනම අයෙකුට ලබා දෙන්න පුළුවන්.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

කඩ කාමර තාවකාලික තක්ස්රුවක් කරලා ඊට පස්සේ ටෙන්ඩර් කරමු.මේ ටික දිර්ඝ කාලිනව දෙන්නේ නෑ.මාසිකව අයකරගන්න දෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.**

නාමිකව මේ අයට මේ පාර දුන්නා කියන්නේ ඊළඟ වතාවේ මෙයාලා ටෙන්ඩර් එකට තරඟ කරනවා.එයාලා මේ කඩ කාමරවල අයිතිකාරයෝ වෙනවා.මේකේ කිසිම නිත්‍යානුකූල භාවයක් නෑ.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේකෙදී ටෙන්ඩර් පටිපාටියක් නෙවේ වෙන්නේ.එයාලාගෙන් එකඟතාවයක් අරගෙන තමයි දෙන්නේ.තාවකාලිකව ආදායම් අයකරගන්න ක්‍රමවේදයක් විදිහට තමයි මේක කරන්නේ.කඩ කාමරවල වැඩ නිම කරලා ඉවර වෙලා ටෙන්ඩර් කරලා වැඩිම ලංසුවකට තමයි දෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**

සියළු දෙනාගෙන් අවසරයි.මට සභාවට අයිති මස්කඩ සම්බන්ධයෙන් කථා කරන්න අවශ්‍යයි.ගිය වර සභාවේදී යෝජනා ස්ථිර කළා මස්කඩ වහලා තිබ්බ කාලයට අදාළව බදු මුදල් නිදහස් කරලා දෙන්න කියලා.ඒ කාලේ ඇතුළත අය කිසිම ව්‍යාපාරික කටයුත්තක් කළේ නෑ.නමුත් බදු මුදල් අයකරගන්න කියලා කොමසාරිස්තුමා දැන් දැනුම් දීලා තියෙනවා.ගොඩක් සභාවල මේ සහනය දීලා තියෙනවා.අපි විමසන්නේ ඇයි මේ සභාවේ විතරක් සහනය නොදෙන්නේ කියලා මම ගරු මහ සභාවෙන් විමසනවා.ඒ මිනිස්සු ගොඩක් අසරණ මිනිස්සු.ඒ අය අහනවා මන්ත්‍රීතුමා ඇයි අපට මෙහෙම කරන්නේ කියලා.ඒ නිසා මේ පිළිබඳව නැවත ඇගයීමට ලක් කරන ලෙස මම ඉල්ලා සිටිනවා.දුප්පත් පෝසත් භේදයකින් තොරව හැකි සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ඒ කාලේ ඇතුළත පිටින් ගෙනත් විකුණන්න ඒ අය අපෙන් ඉල්ලීම් කරලා තිබ්බා.අපි ඒ අවසරය ලබා දුන්නා.ඒ ලිපි සියල්ල පළාත් පාලන කොමසාරිස් විසින් අධීක්ෂණය කරලා අපට මේ මුදල් අයකරගන්න කියන්නේ.ඒ විතරක් නෙවේ කිසිම සභාවක මුදල් අය නොකරන්න අවසරය දීලා නැති බවත් ප්‍රකාශ කළා.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපතිනි - ඒ.ජී.මරියහාමි මැතිණිය**

පසුගිය පස්වෙනිදා සහ හයවන දින ව්‍යාපෘති සැකසීම පිළිබඳ පුහුණු වැඩ සටහනත් තිබුණා.පස්වෙනිදා අපි සහභාගී වුනත් හයවෙනිදා අපිට සහභාගී වෙන්න නොහැකි වුණා.නදීකා මන්ත්‍රීතුමියටත් එදාට සහභාගි වෙන්න නොහැකි වුණා.කාන්තා මන්ත්‍රීවරියන් කිසිම කෙනක් හිටපු නැති නිසා ලේකම්තුමිය ලොකු අපහසුතාවයකට ලක් වුනා.නැවත එවැනි දෙයක් සිදු නොවීමට වගබලා ගන්නා ලෙස මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි ගල්කුලම පොදු වැසිකිළිය මේ වන විට කැලේ වැහිලා.ඒක විවෘත කරන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.ඒ වගේම වීදි ලාම්පු කොට්ඨාශ මන්ත්‍රීතුමන්ලාට දෙනවා කිවා බෙදන්න.නමුත් මම දන්නෙත් නෑ. මගේ ගේ ඉස්සරහත් වීදි ලාම්පුවක් හයි කරලා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ඒ අනුව අද දින සභාවේ වැඩ කටයුතු වලට සහභාගී වී සහයෝගය ලබා දුන් සියළුම දෙනාටම ස්තූතිවන්ත වන අතර,අද දින සභාවේ වැඩ කටයුතු හමාර කරනවා.ස්තූතියි.

2022.09.20 වන දින පැවති ගරු මහ සභාවේ වැඩ කටයුතු පෙ.ව.11.08 ට පමණ අවසන් විය.